ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව - 2010

-----------------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

බැංකුවේ කොටස් හිමියන් සම්බන්ධයෙන් බලනකල 2010 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ එහි පරිපාලිත සමාගමේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ලාභය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැකවෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මාගේ මතය වේ.

**අවධාරණය කළ යුතු කරුණු**

--------------------------------

මාගේ මතය තත්ත්වාගණනය නොකරන නමුත්, පහත කරුණු කෙරහි අවධානය යොමු කරවමි.

බැංකුවේ පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලන්ද මෙහෙයුම්, මූල්‍ය හා ද්‍රවශීල තත්ත්වයන්ගේ පහත වැටීමේ උපනතියක් දැක්වුණු අතර, මෙම කරුණු පරිපාලිත සමාගම නිර්ණය කළ හැකි අනාගත කාලයක් සඳහා අඛණ්ඩව පවතින්නක් ලෙස සැලකීමට තරම් සැක මතු කරයි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ල ගි ප්‍ර)

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ල ගි ප්‍ර) - 18 හි 7 හා 13 ජේදයන්හි දැක්වෙන හඳුනා ගැනීමේ (recognition) මලධර්මය ප්‍රකාරව දේපල සඳහා හිලවු කිරීමේ පිරිවැය ප්‍රාග්ධනිත කළ යුතුය. එහෙත්, ප්‍රධාන කාර්යාලයේ බිම් මහල අළුත්වැඩියා කිරීමේ පිරිවැය මත අදාල වන රු.355,054 ක් වූ එකතු කළ අගය මත බදු ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 26 ජේදය ප්‍රකාරව ආයු ගණක තක්සේරු කිරීම් නිතර ලබා ගැනීමෙන් (අවම වශයෙන් වර්ෂ තුනකට වරක් සැහේ) විශ්‍රාම ප්‍රතලාභ පිරිවැය තීරණය කිරීම අත්‍යවශ්‍ය වේ. එහෙත් බැංකුවට ආයු ගණක තක්සේරු කිරීම් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩපාඩු

2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ගෙවිය යුතු හිඟ ණය ශේෂ එකතුව රු.196,235,777 ක් වූ අතර, වර්ෂයක් ඇතුළත ගෙවිය යුතු මුදල රු.5,068,523 (දෙසැම්බර් වාරිකය) ක් විය. එහෙත් බැංකුව වර්ෂයක් ඇතුළත ගෙවිය යුතු මුදල ජංගම බැරකම් යටතේ දක්වා නොතිබුණි.

### 1.2.3 නොසැසඳූ වෙනස්කම්

පොදු ලෙජරයට අනුව, 2010 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ගනුදෙනුකරු තැන්පතු රු.5,938,847 ක් වූ අතර, උපලේඛනයට අනුව එය රු.6,212,640 ක් විය. ඒ අනුව, වෙනස රු.273,793 ක් විය. තවද, හඳුනා නොගත් ගනදෙනුකරු තැන්පතුවලින් 99% කට වැඩි ප්‍රමාණයක් වර්ෂයකට වඩා පැරණි ඒවා විය.

## 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගනුදෙනුකරු හා බැංකුව අතර එළඹි ගිවිසුමට අනුව ශ්‍රී ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ සේවකයනට ණය ලබා දීමේදී යොදා ගැනීම සඳහා රු. මිලියන 5 ක ආරම්භක තැන්පතුවක් තැබීමට ගනුදෙනුකරු එකඟ වූ අතර, තැන්පතුව ඉක්මවා ණය ලබා දීමේදී සමාගම විසින් තැන්පතුව ඌනපූරණය කිරීමට එකඟ වී තිබුණි. විගණිත දිනය වන 2011 පෙබරවාරි 01 දින දක්වා ලබා දුන් ණය රු. මිලියන 5 ක තැන්පතුව රු.3,217,468 කින් ඉක්මවා තිබුණු අතර, බැංකුව එය ගනුදෙනුකරුගෙන් ඌනපූරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 අගෝස්තු 29 දින පාලක මණ්ඩල අනුමැතියට අනුව ලංකා විදුලිබල මණ්ඩලයෙහි ස්ථාවර තැන්පතුව වූ රු. මිලියන 450 සඳහා කල් පිරීමේදී පොලිය ගෙවන්නේ නම් 22.2% ක වාර්ෂික පොලී අනුපාතයක් හෝ වාර්ෂිකව ගෙවන්නේ නම්, 18.55% ක පොලී අනුපාතයක් වේ. මෙයට පටහැනිව බැංකුව විසින් එකඟ වූ තථ්‍ය වාර්ෂික පොලී අනුපාතය 22.1% ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස කල් පිරීමේ දිනයට වැඩිපුර ගෙවන ලද පොලිය රු.69,391,353 ක් විය.

(ඇ) බැංකුව 2001 වර්ෂයේ සිට 2010 වර්ෂය අවසානය දක්වා සේවක අර්ථ සාධක අරමුදල් ශේෂයෙන් ණය ලබා දී තිබුණි. කෙසේ වුවද, ගිණුම් 6,217 කින් ලැබිය යුතු මුළු අක්‍රීය ණය ශේෂ එකතුව රු.241,829,145 ක් විය. අක්‍රීය ණය කිසිවක් වේ නම්, එය ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලීම් කර ලබා ගත යුතුය. මාස 12 සිට 97 දක්වා වූ කාල පරාසයක හිඟ ණය මුදල් තිබියදීත් බැංකුවට එවැනි අකය ණය සඳහා වාර්ෂිකව ඉල්ලුම් කිරීමට නොහැකි වී තිබුණි. සේවක අර්ථ සාධක අරමුදලින් එක් සාමාජිකයෙකුට ණය දෙකක් ලබා දී තිබුණ අතර, පළමු ණය සම්පූර්ණයෙන් ගෙවා නිම වන තුරු දෙවන ණය සඳහා බැංකුව කිසිදු වාරිකයක් අය කර නොතිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඈ) එකතුව රු.260,354 ක් වූ ණය සහ අත්තිකාරම්වල වැඩිපුර අය කිරීම් අදාල පාර්ශ්වයන්ට ආපසු ගෙවීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ වගකීමක් ලෙස දක්වා තිබුණි.

(ඉ) පවරා ගත් දේපල 19 කින් ලැබිය යුතු මුළු හිඟ ණය ශේෂය රු.10,527,842 ක් වූ අතර, එම දේපල වෙන්දේසියෙන් ලද මුදල් රු.9,839,904 ක් පමණක් විය. ඒ අනුව බැංකුවට සිදු වූ පාඩුව රු.687,938 ක් විය. තවද, 2010 දෙසැම්බර් 31 දිනට මුළු අක්‍රීය ණය 169 කින් ලැබිය යුතු මුළු හිඟ ණය රු.24,525,887 ක් වූ අතර, තක්සේරු වාර්තාවලට අනුව ප්‍රත්‍යාගණිත දේපලවල වෙළඳපල අගය රු.16,763,400 ක් පමණක් විය.

## 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

2008 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල භෞතික ශේෂය හා පොදු ලෙජර ශේෂය අතර වෙනස රු.17,023,483 ක් වූ අතර, වෙනස ස්ථාවර වත්කම් අපහරණ ගිණුම්වලට මාරුකර තිබණි. එහෙත් 2011 පෙබරවාරි අවසානයට වනවිටත් එම වත්කම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1997 අංක 07 දරන නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතේ 16(2) වගන්තියට අනුව බැංකුවේ නිකුතු කොටස් ප්‍රාග්ධනය රු. මිලියන 1,000 ක් විය යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළදී සේවක කොටස් නිකුත් කිරීමෙන් පසුවත් කොටස් ප්‍රාග්ධනය රු.මිලියන 962.088 ක් පමණක් විය.

(ආ) මාස 06 ක් ඉකමවන ලද රු.241,363 ක ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව බැංකු සැසඳුම් ප්‍රකාශනවල පැවතුණි.

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහ පාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශයන්හි V පරිච්ඡේදයේ 5.1 හා 5.2 වගන්තිවලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන කරන ලද පිටපත් අවම වශයෙන් මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, මෙම අවශ්‍යතාවයට බැංකුව විසින් අනුකූල වී නොතිබුණි.

(ඇ) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතේ දෙවන කොටසේ වගන්තියේ 12(අ) සිට (ක) ඡේදයන්ට අනුව, බැංකුවේ ප්‍රධාන අරමුණ වනුයේ නිවාස කාර්යයන් සහ වෙනත් සම්බන්ධිත සේවාවන් සඳහා ණය සහ වෙනත් මූල්‍ය සහායයන් ලබා දීමයි. මෙයට පටහැනිව බැංකුව විසින් කෘෂිකාර්මික කටයුතුවලට පහසුකම් ලබා දීම සඳහා රු. මිලියන 317 ක මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි තැන්පත් කර තිබුණි.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------------

2.1 **මූල්‍ය සමාලෝචනය**

----------------------

2.1.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 188.9 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 91 ක් වූ හෙයින් රු. මිලියන 97.9 කින් ශුද්ධ ලාභයෙ වැඩිවීමක් දැක්වුණි.

2.1.2 **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සහ ඉකුත් වර්ෂ 3 සඳහ මෙහෙයුම් හා මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශයක් පහත දැක්වේ.

| විෂයය | 2010<br>රු.'000 | වැඩිවීම / අඩුවීම | 2009<br>රු.'000 | වැඩිවීම / අඩුවීම | 2008<br>රු.'000 | වැඩිවීම / අඩුවීම | 2007<br>රු.'000 |
|---|---|---|---|---|---|---|---|
| පොලී ආදායම | 2,164,981 | (51,391) | 2,216,372 | 275,070 | 1,941,302 | 245,701 | 1,695,601 |
| පොලී වියදම | 1,339,355 | 242,752 | 1,582,107 | 19,956 | 1,602,063 | (355,453) | 1,246,609 |
| ශුද්ධ පොලී ආදායම | 825,626 | 191,361 | 634,265 | 295,024 | 339,240 | (109,752) | 448,992 |
| වෙනත් මෙහෙයුම් ආදායම | 85,305 | 32,979 | 52,326 | 19,241 | 33,085 | (12,656) | 45,741 |
| ශුද්ධ ආදායම | 910,931 | 224,340 | 686,591 | 314,265 | 372,325 | (122,409) | 494,734 |
| මෙහෙයුම් වියදම | 615,128 | 98,559 | 516,569 | 104,266 | 412,303 | 7,682 | 404,621 |
| බොල් ණය සඳහා ප්‍රතිපාදනය (ණය පාඩු) | 106,895 | 52,942 | 53,953 | 24,551 | 54,402 | 11,426 | 42,976 |
| මෙහෙයුම් ලාභය / (පාඩුව) | 188,908 | 97,840 | 91,068 | 185,448 | (94,380) | (141,517) | 47,137 |

ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී පොලී ආදායම 2.32% කින් අඩුවී පොලී වියදමද 15.34% කින් අඩුවී තිබුණු අතර, පොලී නොවන වියදම 19.08% කින් වැඩි වී තිබුණි. කෙසේ වුවද, පෞද්ගලික පඩිනඩි හා ශුභ සාධන වියදම් 13.5% කින් පමණක් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී කාර්යාල හා වෙනත් වියදම් සැලකිය යුතු ලෙස වැඩි වී තිබුණු බව නිරීක්ෂණය විය.

### 2.1.3 මූල්‍ය සමාලෝචනය

-----------------------

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට හා ඉකත් වර්ෂයේ අවසානයට මූල්‍ය තත්ත්වය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2010 | 2009 | විචලනය | |
|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | % |
| **වත්කම්** | | | | |
| මුදල් හා කෙටි කාලීන අරමුදල් | 84,272 | 163,189 | (78,917) | -48.36 |
| රජයේ සුරැකුම්පත්වල හා වෙනත් ආයෝජනයන් | 1,512,768 | 1,246,622 | 266,146 | 21.35 |
| ණය සහ අත්තිකාරම් | 12,839,825 | 11,912,783 | 927,042 | 7.78 |
| ලැබිය යුතු පොලී | 54,434 | 73,626 | (19,192) | -26.07 |
| අයකර ගත යුතු බදු | 3,721 | 24,899 | (21,178) | -85.06 |
| ආයෝජන සුරැකුම්පත් | 31 | - | 31 | |
| වෙනත් වත්කම් | 123,115 | 159,662 | (36,547) | -22.89 |
| දේපල, පිරියත හා උපකරණ | 755,667 | 720,660 | 35,007 | 4.86 |
| **මුළු වත්කම්** | 15,373,832 | 14,301,441 | 1,072,391 | 7.50 |
| | | | | |
| **වගකීම්** | | | | |
| ගනුදෙනුකරුවන්ගේ තැන්පතු | 7,702,928 | 6,114,802 | 1,588,126 | 25.97 |
| ණය ගැනීම් | 4,781,007 | 5,150,224 | (369,217) | -7.17 |
| වෙනත් බැරකම් | 1,041,239 | 1,315,219 | (273,980) | -20.83 |
| **මුළු බැරකම්** | 13,525,174 | 12,580,245 | 944,929 | 7.51 |
| **අරමුදල් යෙදවීම** | | | | |
| ----------------- | | | | |
| කොටස් ප්‍රාග්ධනය | 962,089 | 962,089 | - | - |
| සංචිත | 886,570 | 759,107 | 127,463 | 16.79 |
| මුළු ප්‍රාග්ධනය හා සංචිත | 1,848,659 | 1,721,196 | 127,462 | 7.41 |
| මුළු වගකීම් හා අරමුදල් යෙදවීම | 15,373,833 | 14,301,441 | 1,072,391 | 7.50 |

## 2.1.4 වැදගත් අනුපාත

------------------

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා බැංකුවේ වැදගත් අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

| | | 2010 | 2009 |
|---|---|---|---|
| | | ------- | ------- |
| | | % | % |
| ලාභදායිත්ව | | | |
| -------------- | | | |
| (i) | ශුද්ධ ලාභ අනුපාතය | 12.94 | 7.42 |
| (ii) | දළ ලාභ අනුපාතය | 36.69 | 27.96 |
| (iii) | පොලී ආදායමට පොලී පිරිවැය | 61.86 | 71.38 |
| (iv) | දළ ලාභයට පොදු කාර්ය වියදම | 79.26 | 86.74 |
| (v) | සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය | 0.91 | 0.40 |
| (vi) | හිමිකම් මත ප්‍රතිලාභය | 7.58 | 3.30 |
| (vii) | කොටසක ඉපැයීම | 20.91 | 8.72 |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය | | | |
| -------------------------------- | | | |
| (i) | හිමිකම් : මුළු වත්කම් | 12.02 | 12.03 |
| (ii) | හිමිකම් : ණය ගැනුම් | 38.67 | 33.42 |
| (iii) | පළමු පෙළ i | 21.09 | 17.63 |
| (iv) | පළමු පෙළ ii | 22.18 | 18.66 |
| ද්‍රවශීල වත්කම් | | | |
| ---------------- | | | |
| ද්‍රවශීල වත්කම් අනුපාතය (අවම 20%) | | 20.92 | 21.19 |

## 2.1.5 බැංකුවේ කල් පිරීමේ ක්‍රියාවලිය

-----------------------------------

බැංකුවේ වතකම් හා වගකීම් පිළිබඳ මාසික විශ්ලේෂණයේදී බැංකුවේ මුළු වගකීම් ප්‍රමාණය ඉතා ඉහළ අගයක වන බව සහ 2010 වර්ෂය සඳහා කෙටි කාලීන ද්‍රවශීලතා අන්තරය මාස 3 දක්වා, මාස 3 සිට 12 දක්වා සහ මාස 12 සිට 36 දක්වා පිළිවෙලින් රු. මිලියන 1,502, රු.මිලියන 3,370 සහ රු. මිලියන 18 වන බව අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

| | මාස 3 දක්වා | මාස 3 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 3 දක්වා | වර්ෂ 3 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| <u>වත්කම්</u> | | | | | | |
| පොලී සහිත | 1,930 | 1,202 | 2,493 | 2,308 | 6,032 | 14,492 |
| පොලී රහිත | 546 | 58 | 21 | 5 | 778 | 882 |
| එකතුව | 2,476 | 1,260 | 2,514 | 2,313 | 6,810 | 15,374 |
| <u>වගකීම්</u> | | | | | | |
| පොලී සහිත | 3,514 | 4,455 | 2,269 | 674 | 3,419 | 14,333 |
| පොලී රහිත | 464 | 175 | 263 | 29 | 110 | 1,041 |
| එකතුව | 3,978 | 4,630 | 2,532 | 703 | 3,529 | 15,374 |
| කල් පිරීමේ අන්තරය | (1,502) | (3,370) | (18) | 1,610 | 3,281 | 0 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු ගනුදෙනුකාර ස්ථාවර තැන්පතුවලින් 65% කට වැඩි ප්‍රමාණයක් අයත්ව තිබුණේ තැන්පත්කරුවන් 11 දෙනෙකුට වූ අතර, එය බැංකුවේ ද්‍රවශීලතාවයට හා ඉදිරි පැවැත්මට අහිතකර ලෙස බලපානු ඇත.

(ii) බැංකුව අත්පත් කර ගත් ඉඩම් දීර්ඝ කාලයක් නොවිකුණා පැවතුණි.

### 2.1.6 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මිලදී ගැනීම්වලදී සැපයුම්කරුවන්ගෙන් මිල කැඳවීම් තුනක් අවම වශයෙන් කැඳවිය යුතු වුවද, එයට පටහැනිව අවස්ථා තුනකදී රු.1,439,130 ක් වටිනා මිලදී ගැනීම් එක් මිල කැඳවීමකින් පමණක් සිදු කර තිබුණි.

(ආ) 2009 වර්ෂය තුළදී රු.990,080 ක් වටිනා අත් ඔරලෝසු 2600 ක් (ත්‍යාග විෂයයන්) බැංකුව විසින් මිලදී ගෙන තිබුණු නමුත් මිල කැඳවීම් සිදු කළ බවට තහවුරු කර ගැනීම සඳහා සාක්ෂි නොතිබුණි. තවද, බැංකුව එම සැපයුම්කරුගෙන්ම පෙර සැපයුමේ හානි වී තිබුණු අත් ඔරලෝසු 767 ක් තිබියදීත් රු.841,221 ක් වටිනා අත් ඔරලෝසු 1977 ක් මිලදී ගෙන තිබුණි.

2.1.7 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තිලිණ තරු විත්‍ර හා රචනා තරඟය

--------------------------------------

ළමා ඉතිරි කිරීම් වැඩි කිරීමට හා පාසැල් ළමුන් අතර බැංකුව පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම සඳහා 2009 ජූලි සිට 2009 සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ අඩු පිරිවැය අරමුදල් එක් රැස් කිරීමේ අරමුණින් "ලෝක ජනාවාස දිනය" සැමරීම පිළිබඳව "තිලිණ තරු විත්‍ර හා රචනා තරඟය" පවත්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම වැඩසටහන 2009 වර්ෂය තුළ සිදු කර තිබුණද, එය 2009 වර්ෂයේ අලෙවි සැලැස්මෙහි හා අයවැයෙහි අතුළත් කර නොතිබුණි.

(ii) ළමුන්ගේ ඉතිරි කිරීම් වැඩි කිරීම සඳහා ඉහත තරඟය පැවැත්වීමේදී රු.2,182,300 ක මුදලක් බැංකුව විසින් වැය කර තිබුණි. එහෙත් තැන්පතු පදනම සත්‍ය වශයෙන්ම වැඩි වී තිබුණේ රු.4,579,161 කින් පමණක් වූ අතර, ප්‍රවර්ධනයන් ඵලදායී නොවූ බව නිරීක්ෂණය විය.

(iii) බැංකුව විසින් ගනුදෙනුකරු පදනම 100,000 කින් වැඩි කිරීමට ඉලක්ක කර තිබුණද, සත්‍ය වැඩිවීම ගනුදෙනුකරුවන් 5,962 ක් පමණක් විය. ඵලදායි ගනුනෙනුකරුවන් වෙතින් තැන්පතු ලබා ගැනීමටද බැංකුව තවදුරටත් බලාපොරොත්තු විය. ශාඛා 25 ක් අතුරින් ශාඛා 16 ක එක් අයකුට තැන්පතු රු.1000 කට වඩා පහළ මට්ටමක විය.

(ආ) වටිනාකම රු.369,533 ක් වූ පිරිමි අත් ඔරලෝසු 846 ක් හා රු.455,840 ක් වූ කාන්තා අත් ඔරලෝසු 1100 ක් ගනුදෙනුකරුවන්ට නිකුත් කිරීමෙන් තොරව ගබඩාවේ රඳවා තිබුණි.

## 2.1.8 මානව සම්පත් කළමනාකරණය

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ කාර්ය මණ්ඩල තොරතුරු එක් සේවකයෙකුට පිරිවැය පහත පරිදි විය.

| සේවක වර්ගය | තථ්‍ය කාර්ය මණ්ඩලය | | පෞද්ගලික පඩි නඩි එකතුව | | සේවකයෙකුට පිරිවැය | |
|---|---|---|---|---|---|---|
| | 2010 | 2009 | 2010 | 2009 | 2010 | 2009 |
| | | | රු. | රු. | රු. | රු. |
| විධායක | 200 | 201 | 190,919,241 | 129,162,692 | 954,596 | 642,600 |
| බැංකු සහකාර හා සමාන්තර කාර්ය මණ්ඩලය | 93 | 93 | 59,536,146 | 30,672,109 | 640,173 | 329,807 |
| වෙනත් | 148 | 76 | 23,016,000 | 13,832,520 | 155,514 | 182,006 |
| එකතුව | 441 | 370 | 213,471,387 | 173,667,321 | 620,117 | 469,371 |

## 3. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර බැංකුවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ප්‍රසම්පාදන
(ආ) ස්ථාවර වත්කම් / ඉන්වෙන්ටරි හා ගබඩා කළමනාකරණය
(ඇ) ණය පරිපාලනය
(ඈ) ප්‍රචාරණය හා ප්‍රවර්ධන වියදම්
(ඉ) පුහුණු වැඩසටහන් හා වැඩමුළු
(ඊ) අත්කරගත දේපල විකිණීම